# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2024 අංක 35 දරන
## දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාව (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2024 ජූනි මස 19 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2024 ජූනි මස 20 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

මිල : රු. 24.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2024 අංක 35 දරන දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාව (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2024 ජුනි මස 19 වන දින]

එල්. ඩී.—ඕ. (අයි.එන්.සී.) 2/2021

## දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව

"දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාව" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වී ඇති රීතිවලට අනුකූලව, එකී පදනම හා සම්බන්ධ පරමාර්ථ සහ සියලු කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ ඊට අදාළ සියලු කාරණා ඵලදායී ලෙස ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

තව ද, එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා එකී පදනම විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

කෙටි නාමය

1. මේ පනත 2024 අංක 35 දරන දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාව සංස්ථාගත කිරීම

2. (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) දැනට දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාවේ සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් මින් මතු බඳවා ගනු ලබන සියලු තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාපිත මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) "දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාව" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, එකී නාමයෙන් ඒ සංස්ථාපිත මණ්ඩලය විසින් ද, එයට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

(2) සංස්ථාපිත මණ්ඩලය, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා ස්වේච්ඡා සමාජ සේවා

සංවිධානයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා හා ඒ සම්බන්ධයෙන් අදාළ කර ගත යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ

3. වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලය සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) නිවන් මඟ කරා ළඟා වීමට "ප්‍රතිපත්ති පූජාව" ක්‍රියාවෙහි යෙදවීම සඳහා බෞද්ධ බැතිමතුන් උනන්දු කිරීම සහ ඒ සඳහා මඟපෙන්වීම;

(ආ) බෞද්ධ බැතිමතුන් තුළ ශීලය, සමාධිය, ප්‍රඥාව පිළිබඳව ආගමික දැනුම වැඩි කිරීම සහ දියුණු කිරීම සඳහා බෞද්ධ ධර්මයට අදාළ පොතපත පළ කිරීම;

(ඇ) "දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ නාහිමියන්ගේ කතිකාවත්" සුරක්ෂිත කොට ක්‍රියාවෙහි යෙදවීම;

(ඈ) බෞද්ධ ධර්මය හා විනය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ඇති වැඩිහිටි භික්ෂූන් වහන්සේලාගේ මඟපෙන්වීම හරහා ධර්මය ඉගැන්වීමෙන් දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ අධ්‍යාපන දහම් සභාවට සම්බන්ධ නවක පැවිදි පිරිසගේ සහ දායක බෞද්ධයන්ගේ දැනුම වැඩි කිරීමට පියවර ගැනීම;

(ඉ) සමානාත්මතාවය ඇති කිරීම සඳහා දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාවට අයත් ශ්‍රී සම්බෝධි ආරණ්‍ය සේනාසනවලට සම්බන්ධ පැවිදි පිරිසට ලැබෙන සඟ සතු සිව්පසය ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාවට සම්බන්ධ අනෙකුත් පැවිදි පිරිසගේ පරිහරණය සඳහා බෙදා දීම;

(ඊ) ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාවේ ඉලක්කවලට ළඟා වීම සඳහා භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වනක් පිරිසගේ පරිහරණය සඳහා බෞද්ධ ධර්මයට අදාළ කටයුතුවලට පහසුකම් සැලසීම;

(ඩ) දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාවේ ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කිරීම;

(ඬ) බෞද්ධ මූලධර්මවලට මුල්තැන දෙමින් නිවන් මඟ කරා ළඟාවීමටත් පව්වු ක්‍රියාවන්ගෙන් මිදීමටත් බෞද්ධ බැතිමතුන්ට මගපෙන්වීම සඳහා පෝය දිනවල සීල හා භාවනා වැඩසටහන් පැවැත්වීම සහ සෑම සතියක ම ධර්ම සාකච්ඡා පැවැත්වීම;

(ඒ) පූජ්‍ය දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ නාහිමියන්ගේ ආගමික කටයුතුවලට අදාළ පොතපත, වීඩියෝ පට සහ ධර්ම කතිකාවත් සුරක්ෂිත කිරීමට පියවර ගැනීම; සහ

(ඓ) බෞද්ධ ධර්මය ක්‍රියාවෙහි යොදවන සහ ශ්‍රී සම්බෝධි ආරණ්‍ය සේනාසන සඳහා දායකත්වය ලබා දීමට කැමති බෞද්ධ බැතිමතුන් පිරිස් ජීවත් වන ප්‍රදේශවල ශ්‍රී සම්බෝධි ආරණ්‍ය සේනාසන පිහිටුවීම.

ආණ්ඩුවේ හෝ පළාත් සභාවක අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් හෝ පළාත් පාලන ආයතනයක් යනාදියේ කාර්ය සමඟ සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය ගැටුම් සහගත නොවන බවට සංස්ථාපිත මණ්ඩලය වගබලා ගත යුතු බව

**4.** සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ, ආණ්ඩුවේ හෝ යම් පළාත් සභාවක අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් හෝ පළාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් ඊට සමගාමීව කරගෙන යනු ලබන ක්‍රියාවක් සමඟ කිසිදු ගැටලුවක් නිර්මාණය නොවන ආකාරයෙන්, අදාළ ලිඛිත නීති යටතේ අවශ්‍ය අනුමතයන්ට යටත්ව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම

**5.** (1) මේ පනතේ විධිවිධානවලට, වෙනත් යම් ලිඛිත නීතියකට සහ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතීන්ට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම, මේ පනතේ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ධුර දරන්නන්ගෙන් සමන්විත වන (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ කමිටුවක් විසින් සිදු කරනු ලැබිය යුතු ය.

(2) (අ) මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ කළමනාකරණ කමිටුවේ ධුර දරනු ලබන සාමාජිකයන්,

(ඈ) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් විධිවිධාන සලසා ඇති ආකාරයට ප්‍රථම කමිටුව පත් කරනු ලබන තෙක් හෝ තෝරා පත් කර ගනු ලබන තෙක් (ආ) වන ඡේදය යටතේ සාදනු ලබන රීතීන්ට යටත්ව සංස්ථාපිත මණ්ඩලයේ අතුරු කමිටුවක් ලෙස කටයුතු කළ යුතු ය.

(ආ) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන පරිදි සංස්ථාපිත මණ්ඩලයේ අතුරු පරිපාලනය සඳහා සහ සංස්ථාපිත මණ්ඩලයේ ප්‍රථම කමිටුවේ සාමාජිකයන් තෝරා පත් කිරීම හෝ පත් කිරීම සඳහා 7 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව රීතීන් සෑදීමට සංස්ථාපිත මණ්ඩලයේ අතුරු කමිටුවට බලය තිබිය යුතු ය:

එසේ වුව ද, 7 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, (2) වන උපවගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට අදාළ විය යුතු ය.

(ඇ) අතුරු කමිටුවේ යම් තීරණයක්, එම රැස්වීම සඳහා පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතරය විසින් ගනු ලැබිය යුතු ය.

(ඈ) මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට අවුරුද්දක කාලයක් ඇතුළත සංස්ථාපිත මණ්ඩලයේ ප්‍රථම කමිටුව පත් කිරීම හෝ තෝරා පත් කර ගැනීම කරනු ලැබිය යුතු ය.

(3) (අ) අනුශාසකවරුන් සහ උපදේශකවරුන් ද ඇතුළුව කමිටුවේ සෑම ධුර දරන්නකු ම අවුරුදු තුනක කාලයක් සඳහා පත් කර ගැනීම හෝ තෝරා පත් කර ගැනීම කළ යුතු අතර, එම අවුරුදු තුනක කාලසීමාව ඉකුත්වීමෙන් පසුව එම ධුර දරන්නා, අනුශාසකවරයා හෝ උපදේශකවරයා නැවත පත් කර ගැනීම සඳහා හෝ තෝරා පත් කර ගැනීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(ආ) යම් ධුර දරන්නකු මියයාම, ඉල්ලා අස්වීම, යම් අශක්නුතාවකට පත් වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා ධුරයක පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවක දී, කමිටුව විසින්, සංස්ථාපිත මණ්ඩලයේ රීති සැලකිල්ලට ගනිමින්, එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා පත් කර ගැනීම හෝ පත් කර ගැනීම කළ යුතු ය.

(ඇ) (ආ) වන ඡේදය යටතේ තෝරා ගත් හෝ තෝරා පත් කර ගනු ලැබූ තැනැත්තා, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා පමණක් ධුරය දැරිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ බලතල

**6.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතරින් කුමන හෝ යම් පරමාර්ථයක් හෝ ප්‍රවර්ධනය කිරීම හෝ ඉටුකර ගැනීම උදෙසා අවශ්‍ය හෝ යෝග්‍ය වන කවර ආකාරයක හෝ සියලු ක්‍රියා සහ කාරණා කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය පහත සඳහන් බලය ද ඇතුළුව සංස්ථාපිත මණ්ඩලයට තිබිය යුතු ය:-

(අ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිල දී ගැනීම, කුලියට ගැනීම, ඉදිකිරීම, අලුත්වැඩියා කිරීම සහ අන්‍යාකාරයෙන් ලබා ගැනීම සහ සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව කමිටුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ ඒවා බැහැර කිරීම;

(ආ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා හෝ එහි බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි, ඍජුව හෝ සංස්ථාපිත මණ්ඩලය විසින් ඒ සම්බන්ධයෙන් බලය පවරන ලද නිලධරයකු හෝ අනුයෝජිතයකු මාර්ගයෙන් සියලු ම කොන්ත්‍රාත්තු හෝ ගිවිසුම්වලට එළඹීම ක්‍රියාත්මක කිරීම හෝ කරගෙන යාම;

(ඇ) ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම හෝ රැස් කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුව ද, සංස්ථාපිත මණ්ඩලය වෙත ලබා දෙන සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් කමිටුව විසින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(ඈ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සකස් කිරීම, ලිවීම, භාර ගැනීම, වට්ටම් දීම, පිටසන් කිරීම, ගනුදෙනු කිරීම, මිලට ගැනීම, විකිණීම සහ නිකුත් කිරීම සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා වහා අවශ්‍ය නොවන යම් අරමුදල්, කමිටුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයකින් ආයෝජනය කිරීම;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති යම් නීත්‍යානුකූල භාරයක් හෝ යම් නිශ්චල හෝ පෞද්ගලික දේපළක් භාර ගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ පරිපාලනය කිරීම;

(උ) සංස්ථාපිත මණ්ඩලයේ නිලධරයන් සහ වෙනත් සේවානියුක්තයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහකිරීම හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය පවත්වාගෙන යාම සහ සංස්ථාපිත මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි වැටුප්, දීමනා හා පාරිතෝෂික ගෙවීම;

(ඌ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව දේශන, සම්මන්ත්‍රණ සහ සමුළු සංවිධානය කිරීම;

(එ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති අනෙකුත් දේශීය සහ විදේශීය ආයතන සමඟ සම්බන්ධතා පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීම;

(ඒ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකාව තුළ දී හෝ විදේශයන්හි දී සංස්ථාපිත මණ්ඩලයේ සේවක පිරිස් පුහුණු කිරීම; සහ

(ඔ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා මේ පනතින් බලය ලබා දෙන වෙනත් සියලු ක්‍රියා සහ දේවල් කිරීම.

සංස්ථාපිත මණ්ඩලයේ රීති

**7.** (1) සංස්ථාපිත මණ්ඩලය විසින්, කලින් කල, යම් මහ සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත සඳහන් සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන්නා වූ රීති සෑදීම නීත්‍යානුකූල විය යුතු ය:—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, සාමාජිකයන් ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු;

(ආ) කමිටුවේ ධුර දරන්නන් තෝරා පත් කර ගැනීම, ධුර දරන්නන් ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ විවිධ නිලධරයන් සහ සේවානියුක්තයන් පත් කිරීමේ නියම සහ කොන්දේසි ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඈ) කමිටුවේ යම් රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, එහි ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(ඉ) කමිටුවේ සහ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයකු වීමට අවශ්‍ය සුදුසුකම් සහ නුසුදුසුකම්;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම;

(උ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය සහ විදේශීය අනෙකුත් ආයතන සමග සම්බන්ධතා පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීමේ ආකාරය පාලනය කරනු ලබන කාර්ය පටිපාටිය; සහ

(ඌ) සාමාන්‍යයෙන් සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම හා එහි පරමාර්ථ ඉටු කිරීම සහ සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීම.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදන ලද යම් රීතියක්, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනිම රැස්වීමක දී, එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන රීති, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එකී පළ කරනු ලැබූ දිනයේ සිට බලාත්මක විය යුතු ය.

(4) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදනු ලැබූ සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු මාස තුනක කාලසීමාවක් ඇතුළත අනුමත කිරීම සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් රීතියක්, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් සිදු නොවිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ යම් රීතියක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(6) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් සැම කල්හි ම සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත් විය යුතු ය.

සාමාජිකයන්ගේ නාමලේඛනය

**8.** කමිටුව විසින්, සාමාජිකයන්ගේ නම, ලිපිනය සහ වෙනත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කරනු ලැබිය යුතු සාමාජිකයන්ගේ නාමලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ අරමුදල

**9.** (1) සංස්ථාපිත මණ්ඩලයට එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය සඳහා සහ ඒ වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සාමාජික මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබුණු සියලු මුදල් 6(ඇ) වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, කමිටුව විසින් අනුමත කරනු ලබන එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාපිත මණ්ඩලයේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී සංස්ථාපිත මණ්ඩලය විසින් දරනු ලබන යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය

**10.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින්, එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාපිත මණ්ඩලයේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කළ යුතු අතර, එකී ගිණුම් එම සුදුසුකම්ලත් විගණකවරයා විසින් සහතික කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා ''සුදුසුකම්ලත් විගණකවරයා'' යන්නෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරී ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී ආයතනයක්,

අදහස් වේ.

**11.** (1) කමිටුව විසින්, සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු පිළිබඳ වාර්තාවක් සෑම මුදල් වර්ෂයක් සඳහා ම සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව, විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය ද, 10 වන වගන්තියේ සඳහන් කරන ලද සුදුසුකම්ලත් විගණකවරයකු විසින් සහතික කරන ලද සංස්ථාපිත මණ්ඩලයේ සියලු වත්කම් සහ වගකීම් පිළිබඳ ලැයිස්තුවක් ද සමඟ, වාර්තාව අදාළ වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ සය මාසයක් ඉකුත් වීමට පෙර බුද්ධශාසන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත සහ 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. වාර්ෂික වාර්තාව

(2) (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාවට, මුදල් වර්ෂය තුළ දී, සංස්ථාපිත මණ්ඩලය වෙත දේශීය සහ විදේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙනම ගිණුම් ප්‍රකාශයක්, සංස්ථාපිත මණ්ඩලය විසින් එළඹෙන ලද සියලු ගිවිසුම් සහ එකඟතා පිළිබඳ විස්තර සහ 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාපිත මණ්ඩලයේ රීති අමුණා තිබිය යුතු ය.

**12.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනම විසින් ගෙවිය යුතු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියලු ණය සහ පදනමට ගෙවිය යුතු සියලු සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලය වෙත ගෙවනු ලැබිය යුතු ය. පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අය විය යුතු ණය

සංස්ථාපිත මණ්ඩලයට චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව

**13.** මේ පනතේ විධිවිධානවලට සහ වෙනත් යම් ලිඛිත නීතියකට යටත්ව, යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාපිත මණ්ඩලය සතුවන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට, සංස්ථාපිත මණ්ඩලයට නීතියෙන් හැකියාව සහ බලය ඇති අතර, සංස්ථාපිත මණ්ඩලය විසින් ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව, 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත්ව, මේ පනතේ කාර්යය සඳහා ඒ සියලු දේපළ දැරිය යුතු ය.

මුදල් සහ දේපළ අදාළ කර ගැනීම

**14.** මේ පනතේ විධිවිධානවලට සහ වෙනත් යම් ලිඛිත නීතියකට යටත්ව, කවර ආකාරයකින් හෝ ලබාගන්නා සංස්ථාපිත මණ්ඩලයේ මුදල් සහ දේපළ සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටු කර ගැනීම උදෙසා පමණක් අදාළ කර ගත යුතු අතර, එයින් කවර හෝ කොටසක් සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ට ලාභාංශ, ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් ඍජුව හෝ අන්‍යාකාරයෙන් නොගෙවිය යුතු හෝ නොපැවරිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව

**15.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස, කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් තමන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව, කමිටුව විසින් තීරණය කරනු ලබන කමිටුවේ ධුර දරන්නකු භාරයේ තිබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ

**16.** (1) සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුණහොත්, ඒ දේපළ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලැබ ඇත්තා වූ ද, වෙනත් යම් උචිත ආයතනයකට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමට පෙරාතුව ම එහි සියලු ණය හා බැරකම් පියවීමෙන්

පසු ඉතිරි වන දේපළ දෙනු ලැබිය යුතු හෝ පවරනු ලැබිය යුතු උචිත ආයතනය, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමතය ඇතිව, සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් විසින් එහි මහ සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**17.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අර්ථ නිරූපණය

**18.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි-

"බැංකුව" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධාන යටතේ වන බලපත්‍රලාභී වාණිජ බැංකුවක් අදහස් වේ;

"දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ නාහිමියන්ගේ කතිකාවත" යන්නෙන්, බුදුරජාණන් වහන්සේ විසින් දේශිත ධර්ම කාරණා පදනම් කොටගෙන, ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාවට සම්බන්ධ බෞද්ධ බැතිමතුන්ට, නිර්වාණය අවබෝධ කර ගැනීමේ උදාරතර පරමාර්ථය ඇතිව විනයානුකූල ජීවිතයකට ඔවුන්ව හුරු කරවීම සඳහා අතිපූජ්‍ය ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ නාහිමියන් විසින් දේශිත බෞද්ධ මූලධර්ම හා ධර්ම විනය අදහස් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර එකී යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන සහ ඉටු කරනු ලබන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම් නීතියකින් හෝ නීතියක් යටතේ ඇති කොට පිහිටුවන ලද යම් අධිකාරයක් අදහස් වේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, 2007 අංක 07 දරන සමාගම් පනත හැර වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද, ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් අන්‍යාකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද යම් සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ; සහ

"ලිඛිත නීතිය" යන්නෙන්, යම් කිසි නීතියක් සහ අනුනීති අදහස් වන අතර පළාත් සභාවක් විසින් සාදන ලද ප්‍රඥප්ති හෝ කවර වූ හෝ නීතියක් යටතේ නියමයන්, ප්‍රකාශන, රීති, අතුරු ව්‍යවස්ථා සහ නියෝග සෑදීමට හෝ නිකුත් කිරීමට හෝ බලය නැතහොත් අධිකාරය ඇති යම් මණ්ඩලයක් හෝ තැනැත්තකු විසින් සාදන ලද හෝ නිකුත් කරන ලද නියමයන්, ප්‍රකාශන, රීති, අතුරු ව්‍යවස්ථා සහ නියෝග ඊට ඇතුළත් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**19.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.